ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2025 අංක 25 දරන
ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2025 දෙසැම්බර් මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2025 අංක 25 දරන
ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 දෙසැම්බර් මස 17 වන දින]

එල්.ඩී. - ඕ 13/2025

1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. 2023 අංක 11 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- 1988 අංක 40 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1අ) වන උපවගන්තියේ -

(අ) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "සියයට දහයක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන වෙනුවට "සියයට දහයක අනුපාතයකට අනුව වූ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ඇ) වන ඡේදයේ "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එහෙත් 2026 ජනවාරි මස 1 වන දිනයෙන් අවසන් වන සෑම වර්ෂයක් සඳහා ම සියයට පහළොවක අනුපාතයකට අනුව වූ; හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම වගන්තියේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2026 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා ම සියයට දහඅටක අනුපාතයකට අනුව වූ,"; සහ

(2) එම වගන්තියේ (1අඅ) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "එක්සත් ජනපද ඩොලර් පනහක්" යන වචන වෙනුවට "එක්සත් ජනපද ඩොලර් සියයක්" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.